
**පරිසරය**



# සුන්දර හෝර්ටන් තැන්න

**යූ.පී.එස්. පතිරණ**

ශුද්ධ භූමියක් වීමට ආගමික සම්බන්ධයක් තිබිය යුතු ම නොවේ. සොබාදහම විසින් මිනිස් වර්ගයාට තිළිණ කළ ශුද්ධ භූමි ද වේ. මේවා ජෛව විවිධත්වයෙන් අගතැන්පත් සංවේදී පරිසර පද්ධතීන් වශයෙන් දැක්විය හැකි ය. සොබාදහම හා මිනිස් වර්ගයාගේ පැවැත්ම අතර පවතින තදබල සම්බන්ධතාව නිසා ම මෙම ශුද්ධභූමි ආරක්ෂා කර ගැනීමේ වගකීම ද මිනිස් වර්ගයා සතුව පවතී. ශ්‍රී ලංකාවේ උසම සානුව 'වශයෙන් සැලැකෙන හොර්ටන් තැන්න ද සොබාදහම විසින් අපට උරුම කරදී ඇති මෙබඳුම ශුද්ධ භූමියකි.

මුහුදු මට්ටමෙන් අඩි 7200 තෙක් පමණ උසින් හා හෙක්ටයාර් 32 ක පමණ භූමියක් පුරා ව්‍යාප්තව පිහිටි හෝර්ටන් තැන්න සොබාදම් දිතිතිය විසින් දයාද කරන ලද සදහරිත වෘක්ෂලතා, පැලෑටි හා පුලිනතලාවන් ද විවිධ වන සතුන්ගෙන් හා සුනිල දිය දහරාවන්ගෙන් ද සමන්විත වූ ජාතික උරුමයක් පමණක් නොව ලෝක ප්‍රජාවට දයාද කළ හැකි ලෝක උරුමයක් ලෙස ද සැලකිය හැකි ය. වසර දහස් ගණනාවක් තිස්සේ මහවැලි, කැලණි, වලවේ යන මහා ගංගාවල නිඹිරි ගෙය වශයෙන් රටට වැදගත් මෙහෙයක් ඉටුකරනු ලබන වෙනත් පරිසර පද්ධතියක් හෝර්ටන් තැන්න හැරුන විට තවත් නොමැති තරම් ය. ශ්‍රීලංකාවේ හදවත බඳු ජල පෝෂිත ප්‍රදේශයක් වන මෙම සුවිශේෂී පරිසර පද්ධතිය එම ගංගා තුනට අමතරව, බෙලිහුල් ඔය, උමා ඔය, බගවත්තලාව ඔය වැනි අතු ගංගා තුනක ද නිජබිම වී පවතී.

> හෝර්ටන් තැන්න සොබාදම් දිනිතිය විසින් දයාද කරන ලද සදහරිත වෘක්ෂලතා, පැළෑටි හා පුලිනතලාවන් ද විවිධ වන සතුන්ගෙන් හා සුනිල දිය දහරාවන්ගෙන් ද සමන්විත වූ ජාතික උරුමයක් පමණක් නොව ලෝක ප්‍රජාවට දයාද කළ හැකි ලෝක උරුමයක් ලෙස ද සැලකිය හැකි ය.

හෝර්ටන් තැන්න නිජබිම වී ඇත්තේ එපමණකට පමණක් නොවේ. ලෝකයේ අසහාය පරසර පද්ධතියක් ලෙස හෝර්ටන් තැන්නට සුවිශේෂී වූ ගෝණුන්, ඕලු මුවන්, දිවියන්, මීමින්නන්, හාවුන්, රිලවුන්, දඬුලේනුන් වැනි ක්ෂීරපායීන් සමග දම් පැහැති මුහුණ සහිත මහවඳුරා යෝධ ලේනා පමණක් නොව, විවිධ වූ පක්ෂී හා මැඩි විශේෂවලට ද තෝතැන්නක් වී ඇත. එපමණක් නොව හෝර්ටන් තැන්නේ හමුවන ශාක විශේෂ වලින් සියයට පනහකට අධික ප්‍රමාණයක් හෝරටන් තැන්නේදී පමණක් දැකිය හැකි පැලෑටි විශේෂ ලෙස සැලකේ. තව ද, සමතල විශේෂ 40 ක් හා ශ්‍රී ලංකවේ වෙසෙන පක්ෂී විශේෂ 80 ක් හෝර්ටන් තැන්න තුළදී නිරීක්ෂණය කළ හැකි බව පැවසෙන අතර ශ්‍රී ලංකාවට ආවේනික පක්ෂී විශේෂ 26 න් 21 ක් ම හෝර්ටන් තැන්න තුළදී හමුවන බව ද දැක් වේ. ශ්‍රී ලංකාවට පමණක් ආවේනික අං කටුස්සා ඇතුළු උරග විශේෂ හා උභය ජීවීන් රැසකද නිජබිම වී ඇත. මීට අමතරව බ්‍රිතාන්‍යයන් විසින් ශ්‍රී ලංකාවට හඳුන්වාදෙනු ලැබූ ට්‍රවුට් මත්ස්‍ය විශේෂ හෝර්ටන් තැන්නේ ජෛව විවිධත්වය වඩාත් පොහොසත් කර ඇත.

ඈත අතීතයේ සිට මාඑලිතැන්න වශයෙන් පැවති මෙම තැන්න ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය යටත් විජිතයක්ව පැවති 1833 දි පමණ මෙහි පැමිණි ප්‍රථම ඉංග්‍රීසි ජාතිකයන් වූ කැප්ටන් විලියම් ෆිෂර් හා කර්නල් ඇල්බට් වොට්සන් යන දෙදෙනා විසින් එවක ලංකාවේ ඉංග්‍රීසි ආණ්ඩුකාරයාව සිටි සර් රොබට් හෝර්ටන්ගේ නමින් හෝර්ටන් තැන්න නම් කරන ලද බව කියැවේ. බ්‍රිතාන්‍ය සමයේදී හෝර්ටන් තැන්න සොයා ගත් අවස්ථාවේ සිට එය බ්‍රිතාන්‍යයන්ගේ මෙන්ම සංචාරකයන්ගේ දඩයම් බිමක් වී පැවති බව පෙනී යයි. විශේෂයෙන් දඩයම් බල්ලන් සමග අසුපිට නැගී මෙහි පැමිණි සුදු ජාතිකයන් මෙහි බහුලව ජීවත්වූ ගෝණුන් දඩයම් කිරීම විශේෂ විනෝදාංශයක් කර ගත් බව පෙනේ.

බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේදී හෝර්ටන් තැන්න පිළිබඳ තම අත්දැකීම් ලියා තැබූ සර් සැමුවෙල් බේකර් හැරුනු විට හෝර්ටන් තැන්න හා සම්බන්ධ බ්‍රිතාන්‍ය ජාතිකයන් අතරට ජේම්ස් ඇන්ඩර්සන් හා තෝමස් ෆාර් ද ඇතුළත් වී තිබේ. විශේෂයෙන් හෝර්ටන් තැන්නේ පිහිටි මනස්කාන්ත දියඇල්ලක් වන බේකර්ස් ඇල්ල අදත් සැමුවෙල් බේකර් සිහිපත් කරවයි. බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමයේ සුදු මහත්වරුන්ගේ ජනප්‍රිය දඩබිමක් හා කෙලි බිමක් වූ හෝර්ටන් තැන්න සුවිශේෂී පරිසර පද්ධතියක් ලෙස සලකා ආරක්ෂා කිරීම සඳහා බ්‍රිතාන්‍ය යුගය තුළ දී ම

> පරිසරයට දරාගත හැකි ප්‍රමාණය ඉක්මවා පාලනයකින් තොරව සති අන්ත හා පාසල් නිවාඩු කාලවලදී ඇදී එන දේශීය සංචාරකයන් හා ඔවුන්ගේ වාහන සංඛ්‍යාව නිසාත්, සමහර තරුණ සංචාරකයන්ගේ පරිසර විරෝධී ක්‍රියා නිසාත්, හෝර්ටන් තැන්න පරිසර පද්ධතියට හානි පැමිණෙමින් පවතී.

එනම් 1850 දී පියවර ගැනීම ඉතා වැදගත් සන්ධිස්ථානයක් විය. කෙසේ වුවද හෝර්ටන් තැන්න ස්වභාවික රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කෙරුනේ ඊටත් සියවසකට පසු එනම් 1969 දී ය. 1988 සිට හෝර්ටන්ගේ තැන්න ශ්‍රී ලංකාවේ ජාතික වනෝද්‍යානයක් ලෙස නම් කර තිබේ. බදුල්ල, රත්නපුරය, නුවරඑළිය යන දිස්ත්‍රික් වලට මායිම්ව පිහිටා ඇති හෝර්ටන් තැන්නට නැගෙනහිරින් ශ්‍රී පාද අභය භූමියත්, වයඹ දෙසින් ආගර බෝපත් වන රක්ෂිතයත් පිහිටා තිබේ. ඒ හැරුනවිට පට්ටිපොල, අඹේවෙල වන පියසත්, ඔහිය වන රක්ෂිතයත් හෝර්ටන් තැන්නේ මායිම්ව පවතී. ශ්‍රී ලංකාවේ උසින් දෙවන හා තෙවන ස්ථාන ගනු ලබන කිරිගල්පොත්ත (අඩි 7856) හා තොටුපොල කන්ද (අඩි 7741) පිහිටා ඇත්තේ ද හෝර්ටන් තැන්න ආශ්‍රිතව ය. නිබඳව මිහිදුම් සළුවෙන් වැසී යන හෝර්ටන් තැන්නේ සාමාන්‍ය උෂ්ණත්වය උපරිම වශයෙන් සෙල්සියස් 17 ත් අවම වශයෙන් සෙල්සියස් 0 අතර වෙනස් වේ. විශේෂයෙන් වර්ෂයේ ජනවාරි, පෙබරවාරි මාසයන් හි දී තෘණතලා මත මිදුණු තුෂාර හිම හෝර්ටන් තැන්නේ සුවිශේෂී දැක්මෙකි. වසර පුරා පැතිර පවත්නා ඒකාකාරී වර්ෂාපතනයක් සහිතව හෝර්ටන් තැන්නට මීටර් 2000 කට වැඩි වර්ෂාපතනයක් ලැබේ.

වර්ග කිලෝ මීටරයක පමණ භූමි ප්‍රදේශයක් තුළ උපරිම ජෛව විවිධත්වයක් පවතින "උණුසුම් ස්ථාන" වශයෙන් සැලකෙන ලෝකයේ සුවිශේෂ පරිසර පද්ධතීන් අතරට එක් වී ඇති ශ්‍රී ලංකාවේ එබඳු එක් ස්ථානයක් ලෙස හෝර්ටන් තැන්න ද ගණන් ගැනේ. කඳුකර තණබිම් සහ කඳුකර සදහරිත වැසි වනාන්තර යන ප්‍රධාන වෘක්ෂලතා විතානයන් වර්ග දෙකකින් සමන්විත හෝර්ටන් තැන්න විවිධ ශාක හා සත්ත්ව ප්‍රජාවන්ගේ ද පාරාදීසයකි. ප්‍රධාන වන තීරය හා වගුරු අතර පිහිටි තෘණ භූමිවල විවිධ සංශ්‍රේණික අවධි වලින් යුක්ත තෘණ වර්ග හඳුනාගෙන තිබේ. දිය පාසි, බෙරලිය පාසි, කෙකටිය වර්ග වැනි ජලාශ්‍රිත ශාක මෙන් ම ජලධාරා දෙපස උණ ශාක වර්ග ද සරුවට වැඩී ඇති හෝර්ටන් තැන්නේ විශාල ශාක විශේෂ 57 ක් පමණ හඳුනාගෙන ඇත. ඒ අතරින් හෝර්ටන් තැන්නේ චමත්කාරය වඩමින් දැකුම්කළු මල් හටගන්නා මහ රත්මල් ශාකය ශ්‍රී ලංකාවට අවේනික ඉතා වැදගත් ශාකයකි. මෙහි මල්ඵල ගැනෙන්නේ වසර 12 කට පමණ වරක් යැයි පැවසේ. මීට අමතරව ලෝකයේ ඉපැරණි ශාක විශේෂයක් ලෙස සැලකෙන යෝද මීවන ශාකය මෙහි දක්නට ලැබෙන සුවිශේෂී ශාක විශේෂයකි. විශේෂයෙන් අලංකාර උඩවැඩියා විශේෂ ද, බිනර, බෝවිටියා නෙලු ශාක ද සමග තුරු මත අතුපතර එල්ලෙමින් පවතින සුදු රැවුලා වැනි ලයිකන ශාක වර්ග ද හෝර්ටන් පරිසර පද්ධතියට සුවිශේෂී අලංකාරයක් එක් කර තිබේ.

හෝර්ටන් තැන්න වඩාත් සුන්දර ස්ථානයක් බවට පත්වීමට එහි පිහිටා ඇති ස්වභාවධර්මයේ විශ්මිත නිර්මාණයක් වන මනස්කාන්ත ලෝකාන්තය ද හේතු වී තිබේ. හෝර්ටන් තැන්න වනෝද්‍යාන කාර්යාලයේ සිට කි.මී. 4 ක් පමණ පයින් ගමන් කළ විට හමු වන කුඩා ලෝකාන්තයට සැතපුම් කාලක් පමණ ඔබ්බෙන් මහා ලෝකාන්තය පිහිටා තිබේ. මහා ලෝකාන්තයේ ස්වභාවික සුන්දර බව නැරඹීමට නම් මීදුම අඩු වෙලාවක එය නැරඹිය යුතු ය. අඩි 3700 ක් පමණ ගැඹුරු බියකරු බෑවුම් සහිත ලෝකාන්තයේ පතුල පැහැදිලිව දැක ගත නොහැකි නිසාත්, එම ස්ථානය හිටි ගමන් මීදුමෙන් වැසී යන නිසාත් එතැන ලෝකයේ අන්තයක් ලෙස දිස්වන නිසාත්, මෙම ස්ථානයට ලෝකාන්තය යැයි යෙදී තිබීම ගැන පුදුම විය යුතු නොවේ.

ඉතා සංවේදී පරිසර පද්ධතියක් ලෙස සැලකෙන හෝර්ටන් තැන්නේ අනාගත පැවැත්ම උදෙසා වර්තමානයේ අභියෝග හා තර්ජන රැසකට මුහුණ දීමට සිදු වී තිබේ. විශේෂයෙන් පරිසරයට දරාගත හැකි ප්‍රමාණය ඉක්මවා පාලනයකින්තොරව සති අන්ත හා පාසල් නිවාඩු කාලවලදී ඇදී එන දේශීය සංචාරකයන් හා ඔවුන්ගේ වාහන සංඛ්‍යාව නිසාත්, සමහර තරුණ සංචාරකයන්ගේ පරිසර විරෝධී ක්‍රියා නිසාත්, හෝර්ටන් තැන්න පරිසර පද්ධතියට හානි පැමිණෙමින් පවතී. හෝර්ටන් තැන්න වනෝද්‍යානය තුළට පොලිතින් හා විවිධ ආගන්තුක ද්‍රව්‍ය රැගෙන යාම තහනම් වුවත් තවමත් සමහර සංචාරකයන් එවැනි අපද්‍රව්‍ය

75 පිටුවට

